කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

නීති පීඨය

නීතිවේදී (ගෞරව) උපාධි පරීක්ෂණය - දෙවන වසර

පළමු සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2025

**LAW 21403 - දේපළ නීතිය**

(පැ දෙකයි මිනිත්තු 15 යි)

මුළු ප්‍රශ්න ගණන : 04

ඕනෑම ප්‍රශ්න <u>දෙකකට (02)</u> පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

1. **A** සහ **B** කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

(A) හවුල් හිමිකරුවෙකුට මුළු ඉඩමෙන් නොබෙදුණු කොටසකට හිමිකම් ඇති අතර හවුල් දේපලෙහි නිශ්චිත කොටසකට හිමිකම් ප්‍රකාශයක් ඉල්ලා සිටිය නොහැක.

මෙම ප්‍රකාශයේ වලංගුභාවය විශ්ලේෂණය කරන්න. අදාළ නෛතික මූලධර්ම සහ විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 10)

(ආ) සමන්, කවීෂා සහ තරිඳු ඔවුන්ගේ මිත්තණියගෙන් අන්තිම කැමති පත්‍රයක් රහිතව උරුම වූ අක්කර 10 ක දේපළක සම හිමිකරුවෝ වෙති. මෙම දේපළට සාරවත් කෘෂිකාර්මික ඉඩමක්, තේ වතු යායක් සහ කුඩා නිවසක් ඇතුළත් නමුත් එය විධිමත් ව බෙදා වෙන්කිරීමක් සිදුවී නොමැති අතර හිමිකම හවුල් හිමිකමක් ලෙස පවතී.

උරුමයෙන් පසුව, සමන් තේ වතුයාය අබලන් වී ඇති බවත් වටිනාකම අහිමි වීමේ අවදානමක් ඇති බවත් පවසමින් තේ වතුයාය කළමනාකරණය කිරීමට මූලිකත්වය ගත්තේය. ඔහු වගාව සඳහා කම්කරුවන් කුලියට ගත් අතර, වාරිමාර්ග පද්ධතියේ වැඩිදියුණු කිරීම් සඳහා මුදල් යෙදවූ අතර කවීෂා සහ තරිඳුගෙන් අදහස් විමසීමකින් තොරව දේශීය තේ සැකසුම් සමාගමක් සමඟ අවිධිමත් ආකාරයේ සැපයුම් ගිවිසුමකටද එළඹියේය. ඔහු විසින් නිවසේ අගුලක් සවි කර එය සති අන්ත විවේකයන් ගත කිරීම සඳහා භාවිතා කිරීමට පටන් ගත් අතර, එමඟින් අනෙකුත් හවුල් හිමිකරුවන්ට ප්‍රවේශ වීම වළක්වන ලදී.

නගරයේ ජීවත් වන සහ වගාවට ක්‍රියාකාරීව සහභාගී නොවන කවීෂා, සමන් විසින් සිදු කරන ලද වැඩිදියුණු කිරීම් මෑතකදී සොයාගෙන ඇත. ඇය වතුයායෙන් ලැබෙන ලාභයෙන් කොටසකට තමාට ඇති අයිතිය තහවුරු කරන අතර ඉදිහිට නිවසට පැමිණීම සඳහා නිවසට ප්‍රවේශ වීමට අවසර ඉල්ලා සිටී. ඉඩම සම්බන්ධයෙන් යම් තීරණයක් ගැනීමට පෙර තමන්ගෙන් විමසිය යුතු බවද කවීෂා අවධාරණය කරයි. තරිඳු, වසර කිහිපයක් තිස්සේ සෘතුමය භෝග සඳහා භාවිතයට නොගත් ඉඩමෙන් කොටසක් වගා කරමින් සිටින අතර, තරිඳුගේ ක්‍රියාකලාපය තම වතුකරයේ කළමනාකරණයට මැදිහත් වීමක් වන බවත්, තරිඳු වතුකරයට කිසිදු දායකත්වයක් නොදෙන බවටත් තර්ක කරන සමන්ගෙන් විරෝධතාවලට ද මුහුණ පෑමට සිදුව ඇත.

විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් කවිෂා සහ තරිඳුට උපදෙස් දෙන්න.

(ලකුණු 20)

2. "සාම්ප්‍රදායිකව, වැඩිදියුණු කරන්නා සතු මානසික අංශයේ අවශ්‍යතා ලෙස සිවිල් භුක්තිය (*civilis possessio*) සහ සද්භාවය සලකනු ලැබේ. මෙම ප්‍රවේශයේ නියෝජිතයා වන්නේ 'ඉඩම තමාගේම යැයි යන විශ්වාසය යටතේ එය වැඩිදියුණු කළ සද්භාවී භුක්තිකරුවකුට වන්දි ගෙවීමට අපගේ නීතිය ඉඩමේ හිමිකරුට බල කරයි' යන ප්‍රකාශයන්ය."

*Willoughby's Consolidated Co Ltd v. Copthall Stores Ltd 1918 AD 1*

ජී එල් පීරිස් , *ශ්‍රී ලංකාවේ දේපල නීතිය* , පළමු වන වෙළුම (පළමුව ප්‍රකාශයට පත් කරන ලද්දේ 1976, දෙවන සංස්කරණය,ස්ටැම්ෆර්ඩ් ලේක් ප්‍රකාශකයෝ , 2017) පි. 31 හි උපුටා දක්වා ඇත.

ඉහත ප්‍රකාශ මත පදනම්ව, පහත ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න:

අ) රෝම ලන්දේසි නීතිය යටතේ සිවිල් භුක්තිය පිළිබඳ සංකල්පය නිර්වචනය කර පැහැදිලි කරන්න.

(ලකුණු 4)

ආ) අදාළ නඩු නීතිය උපුටා දක්වමින් සිවිල් භුක්තිය පිළිබඳ සාම්ප්‍රදායික මතය සාකච්ඡා කරන්න.

(ලකුණු 6)

ඇ) වැඩිදියුණු කරන්නන්හට වන්දි නිශ්චය කිරීමේදී සමකාලීන ශ්‍රී ලාංකික අධිකරණ සිවිල් භුක්තිය පිළිබඳ මෙම සාම්ප්‍රදායික අවශ්‍යතාවයෙන් බැහැර වී ඇත්දැයි යන්න විශ්ලේෂණය කරන්න. අදාළ නඩු නීතිය ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 20)

3. **A** හෝ **B** කොටසට පිළිතුරු සපයන්න.

(A) රුවන්ට කොළඹ තදාසන්න ප්‍රදේශයේ විශාල ඉඩමක් හිමිව ඇති අතර එය පරම්පරා ගණනාවක සිට ඔහුගේ පවුලට අයත්ව පවතී. ඔහුගේ ඉඩමෙන් කොටසක් පොදු යටිතල පහසුකම් ව්‍යාපෘතියක් සඳහා පවරා ගන්නා බවට පසුගියදා රජයේ අධිකාරියකින් ඔහුට දැනුම් දීමක් ලැබිණි. මෙම අත්පත් කර ගැනීම ව්‍යවස්ථාපිත අධිකාරියක් යටතේ සිදු කරන බවත්, මාස දෙකක් ඇතුළත නිශ්චිත ප්‍රදේශයෙන් ඉවත් වන ලෙස රුවන්ට උපදෙස් දී ඇති බවටත් නිවේදනයේ සඳහන් වේ. අත්පත් කර ගැනීම අසාධාරණ බවත්, ලබා දෙනු ලබන වන්දි මුදල ප්‍රමාණවත් නොවන බවත් නිසා ඔහු කනස්සල්ලට පත්ව සිටී.

රුවන් තම දේපළ සම්බන්ධයෙන් රාජ්‍ය මැදිහත්වීමේ නීත්‍යානුකූලභාවය සහ ඔහුගේ නීත්‍යානුකූල අයිතිවාසිකම් කඩවී ඇත්ද යන්න සම්බන්ධයෙන් නීති උපදෙස් පතයි. ඉහත තත්ත්වය සැලකිල්ලට

ප්‍රනාන්දුගේ හැසිරීම හේතුවෙන් ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ඔහුගේ ප්‍රමුඛතාවය අහිමි වන බවට විනිසුරුවරයා තීන්දු කළේය.

ඉහත සිදුවීම මත පදනම්ව, පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න:

අ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ලියාපදිංචි වීමට සුදුසුකම් ලබනුයේ කුමන ලේඛනද?

(ලකුණු 5)

ආ) ප්‍රනාන්දුගේ අභියාචනය විභාග කරන අභියාචනාධිකරණයේ විනිසුරුවරයා ඔබ යැයි උපකල්පනය කරන්න.දිසා විනිසුරුවරයාගේ තීරණය තහවුරු කළ යුතුද යන්න විශ්ලේෂණය කරමින් තීන්දුවක් ලියන්න. ඔබගේ පිළිතුර අදාළ නඩු නීතිය ඇසුරින් තහවුරු කරන්න.

ඔබේ තීන්දුව පහත කරුණු සාකච්ඡා කළ යුතුය.

- ප්‍රනාන්දුගේ හිමිකම් පෑමට ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 7 වන වගන්තියේ අදාළත්වය.

(ලකුණු 20)

- ප්‍රනාන්දුගේ හිමිකම් පෑමට ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 10 වන වගන්තියේ අදාළත්වය.

(ලකුණු 5)